ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ විද්‍යා පදනම් පාඨමාලාව - 2 වන මට්ටම
අවසාන පරීක්ෂණය
කළමනාකරණය හැඳින්වීම : SSF 2302
අධ්‍යයන වර්ෂය - 2006

කාලය : පැය තුනයි (03)

දිනය : 2006.11.25

වේලාව : ප.ව. 1.00 - ප.ව. 4.00

* ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයකටවත් පිළිතුරු සපයන්න.
* ඉතා පැහැදිලි අකුරින් පිළිතුරු සපයන්න.
* එක ප්‍රශ්නයකට ලකුණු (20) බැගින් දෙනු ලැබේ.

## පළමුවන කොටස

1. (අ) "සංවිධානය" යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 04)
   (ආ) සංවිධාන අරමුණු ළඟාකර ගැනීම සඳහා ඉහත කී සංකල්පය කුමන අයුරින් උපකාරී වේද? (ලකුණු 08)
   (ඇ) කළමනාකරණ කාර්යයන් සංවිධානයන්ට වැදගත් වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 08)

2. (අ) "අධිකාරය" යනු කුමක්ද? (ලකුණු 04)
   (ආ) රේඛීය අධිකාරය මාණ්ඩලික අධිකාරයෙන් වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 08)
   (ඇ) අධිකාරය පැවරීමේ වාසි මොනවාද? (ලකුණු 08)

3. (අ) කළමනාකරණ කාර්යයන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)
   (ආ) සංවිධාන සටහනක් ඇඳ එහි අංග පැහැදිලි කරන්න. (ලකුණු 08)
   (ඇ) මූලික පාලන ක්‍රියාදාමය විස්තර කරන්න. (ලකුණු 08)

## දෙවන කොටස

4. (අ) කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ ගුරුකුල හතරක් නම් කරන්න. (ලකුණු 04)
   (ආ) කළමනාකරුවෙකු, නායකයෙකු වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)
   (ඇ) කළමනාකරණයේදී සංවිධාන ක්‍රියාදාමය වැදගත් වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 08)

5. (අ) සැලසුම්කරණය යනු කුමක්ද? (ලකුණු 04)
   (ආ) කළමනාකරුගේ නායක කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 08)
   (ඇ) සහභාගිත්ව නායකත්ව ශෛලිය විස්තර කරන්න. (ලකුණු 08)

6. පහත සඳහන් සංකල්ප හතරක (04) සමාන අසමානතා දක්වන්න.
   (අ) බලවාදී නායකත්ව ශෛලිය හා නිදහස් වාදී ශෛලිය
   (ආ) කාර්යක්ෂමතාවය සහ කාර්ය සඵලතාවය
   (ඇ) භෞතික පරිසරය සහ මානව පරිසරය
   (ඈ) ශාරීරික අවශ්‍යතා සහ ආරක්ෂක අවශ්‍යතා
   (ඉ) සම්බන්ධීකරණය සහ කළමනාකරණය

(4×5 = ලකුණු 20)

## රචනා කොටස

7. (අ) "යහපත් සේවා පරිසරය" යන්නෙන් ඔබට කුමක් වැටහේද? (ලකුණු 04)

(ආ) කාල කළමනාකරණය සඳහා යොදාගනු ලබන සරල ශිල්ප ක්‍රම දෙකක් විස්තර කරන්න. (ලකුණු 08)

(ඇ) කාල කළමනාකරණය පිළිබඳව පැරටෝගේ 80/20 සිද්ධාන්තය යනු කුමක්ද? (ලකුණු 08)

8. (අ) 'අභිප්‍රේරණය' නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ආ) මාස්ලෝගේ මිනිස් අවශ්‍යතා ධුරාවලිය මගින් හඳුනාගත් අවශ්‍යතාවයන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ඇ) සන්නිවේදන ක්‍රියාවලිය යනු කුමක්දැයි විස්තර කරන්න. (ලකුණු 08)

9. පහත සංකල්ප අතරින් හතරක් (04) පැහැදිලි කරන්න.

(අ) 'X' න්‍යාය
(ආ) වගකීම
(ඇ) පාලන අවකාශය
(ඈ) රේඛීය කළමනාකරණය
(ඉ) කාල විගණනය

(4×5 = ලකුණු 20)

***** සියළුම හිමිකම් ඇවිරිණි *****